**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
Saliya Galappaththie
0422 671 826
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name** - Sannasa Pty Ltd
BSB - 013303
Acc - 208133398

**සන්නස පිරිවර**
චාමර ලක්ෂාන්
ආරියනන්ද දොඹගහවත්ත
සාලිය ගලප්පත්ති
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්4ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත



# ජාතිවාදයට එරෙහි ජනතාව එක්වෙති

ඉතා සුලුතර පිරිසකගේ මෙහෙයවීමෙන් සහ සහභාගිත්වයෙන් රටේ තැනින් තැන ක්‍රියාත්මක වූ ජාතිවාදී ප්‍රවණතාවට එරෙහිව ජාතාවාදී විරෝධී ජනතාව එකමුතුව සිටීම පසුගිය දිනවල විශේෂයෙන් කැපී පෙනුණි. ජාතිවාදීන් විසින් කඩා බිඳින්නට තැත් කළ ස්ථාන ආරක්සා කිරීමට පමණක් නොවේ කඩා බිඳ දැමූ තැන් වහ වහා පිළිසකර කර දෙන්නටත් ජනතාව එක්රොක් වනු පෙනුණි.

ආනඩුවේ මදීනා හෝටලය ප්‍රදේශයේ කාගේත් ආදරය දිනාගත් ව්‍යාපාරයකි. එය ජාතිවාදීන් විසින් ගිනි තබනු ලැබ පැය 18ක් ඇතුළත නැවත යථා තත්වයට පත් කරන්නට ප්‍රදේශයේ ජනතාව කටයුතු යොදා තිබුණි. මේ ඒ කතාවයි.

## ගිනි තබන මිනිසුන් අතර ගිනි නිවන මිනිස්සු




මේ සටහන උපුටා ගත්තේ රංජිත් කීර්ති තෙන්නකෝන් ගේ ෆේස්බු ක් පිටුවෙනි.

## ආනමඩුවේ මදීනා හෝටලයට ගහන්න ආවේ O/L - A/L ළමයි.

අන්තර් ජාලය භාවිත කරමින් මාර්තු 10 සවස 3 ට පමණ ආනමඩුව ද.මු. දසනායක ක්‍රීඩාංගනයට රැස්වන ලෙස "සිංහල, බෞද්ධ" දේශප්‍රේමීන්ට කැදවීමක් ලැබී තිබුණි. ඒ අනුව, පැමිණි පිරිස 21 කි. බහුතරය සා.පෙ., උ.පෙ., ඉගෙන ගන්නා ළමුන් ය. එයින් 7 දෙනෙකු බයිසිකල් දෙකක් හා ස්කූටරයක නැගී මදීනා මුස්ලිම් හෝටලය අසලට පැමිණ එයට ගිණි තබා



ඇත.

දැන් ඒ ගිණි තබන්නට පැමිණි 7 න් 4 ක් පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ ඇත. ඉතිරි තිදෙනා ද හෙට උදෑසන වන විට අත්අඩංගුවට ගනු ඇත. ඔවුන් සියලූ දෙනා පාසල්

**ආනමඩුවේ ද, රත්නපුරේ ද, කාලකන්නි නරුමයින් විනාශ කර ඇත්තේ මේ මල් වැනි ළමයින් ගේ සිත් ය.**

යන දරුවන්ය. වාසනාවකට සිංහල බෞද්ධයන් 95%කටත් වැඩි ආනමඩුවේ තිබෙන මුස්ලිම් කඩ තුනට ජාතිආලය පැතිරුනේ නැත. ඒ වෙනුවට එකාවන්වන්, පැය 12 කට ත් අඩු කාලයකින් මදීනා හෝටලයට වහලයක් ගසා, කෙටි කෑම ටිකක්, බනිස්, ස්පංචි ටිකක්, කෙසෙල් කැනක් රැගෙන විත් නැවත හෝටලය විවෘත කළේය. උමතුව පරාජය කළේය. සාමුහිකත්වය පෙන්වීය.

8 වන පිටට